299

RARE

# ශ්‍රී ලංකාවේ විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම පිළිබඳව සමාජ හා මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්

*(ඌරාපොල සහ පැල්මඩුල්ල පුනරුත්ථාපන ආයතන ඇසුරෙන්)*

යූ.පී.ඒ.ඩී.කේ.පී. කරුණානායක

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 299 |
| වර්ග අංකය | |

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ දර්ශන විෂය පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධිකාවකි.

දර්ශන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය.

**2000 දෙසැම්බර්**

# සාරාංශය (Summary)


යම්කිසි පර්යේෂණයක් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ තෝරාගත් පර්යේෂණ ගැටළුවට පිළිතුරු සපයා ගැනීමයි. මෙහිදී පර්යේෂණය කිරීම සඳහා තෝරා ගන්නා ලද ගැටළුව සම්බන්ධ යම් සිද්ධියක් ඇති වී තිබෙන ආකාරය හෝ ඒ සම්බන්ධ හේතු සාධක අරමුණු කර ගෙන එම කරුණු මත අදාළ ප්‍රතිඵලයන් ලබා ගැනීමට උත්සාහ ගෙන ඇත.

පර්යේෂණයට යොදාගන ලබන ක්‍රමවේදයන් පවා තීරණය වනුයේ පර්යේෂණ ගැටළුවට අදාළව වේ. මා හට ලැබී ඇති සීමිත කාල සීමාව ප්‍රයෝජනවත් හා අර්ථවත් ලෙස යොදා ගැනීමට පර්යේෂණ මාතෘකාවට අනුව ගොඩනගා ගත් පර්යේෂණ ගැටළුව වනුයේ

"මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූවන් සමාජයට වැඩදායක පුද්ගලයන් බවට පත්කල හැකි ද?" යන්න වේ.

පුනරුත්ථාපන ආයතන ඇසුරෙන් සිදු කරනු ලැබූ පර්යේෂණයේ ගුණාත්මක භාවය සඳහා මෙම පර්යේෂණ ගැටළුව මහෝපකාරී විය. මේ තුළින් අවශ්‍ය දත්ත ක්‍රමවත්ව රැස්කර ගත හැකි වූ අතර අනවශ්‍ය දත්ත ඒකරාශී වීම වළක්වා ගත හැකි විය.

පර්යේෂණ ගැටළුවට අදාළව දත්ත ඒකරාශී කර ගැනී ම සඳහා ක්‍රමවේදයන් කිහිපයක් යොදා ගැනීමට මා හට සිදු විය. මෙහිදී පර්යේෂණයේ විද්‍යාත්මක භාවය ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු විවිධ ක්‍රියාමාර්ගයන් හැකිතාක් උපයෝගී කර ගනිමින් නිබන්ධනයේ විද්‍යාත්මක බව වඩාත් තහවුරු කිරීමට මම සැම විට ම උත්සාහ ගතිමි.

ප්‍රකෘතියේ අභ්‍යන්තරය ද, වස්තූන්ගේ සහ ප්‍රපංචවල හරය ද ඒවායේ ක්‍රියාකාරීත්වයේ සහ සංවර්ධනයේ නියාමයද හෙළි කිරීම විද්‍යාත්මක දැනීමේ ප්‍රධාන පරමාර්ථය වේ. එසේ වුව ද ප්‍රපංචවල මතුපිට හරය සහ නියාම නොමැත. විද්‍යාවේ සහ සම්භාවිතයේ දීර්ඝ කාලීන හා සංකීර්ණ සංවර්ධනයේ දී ඒවා සොයා ගැනීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම සහ විධි කිහිපයක් ම භාවිතා කර ඇත.

මෙම ක්‍රම වේදයන් පොදු සර්ව ව්‍යාපී වැදගත්කමක් දරයි. විවිධ විද්‍යාවන්හි පර්යේෂණ සඳහා මේවා භාවිතා කරයි. මෙම පර්යේෂණයේදී ප්‍රධාන අංශ 2 ක් යටතේ අදාළ ක්‍රම

වේදයන් භාවිත කර ඇත. එනම් ලිඛිත මූලාශ්‍ර සහ අලිඛිත මූලාශ්‍ර ලෙසට ය. සමාජීය විද්‍යාවන්හි මෙම ක්‍රම දෙකටම අදාළ දැනුම ගොඩනගා ගැනීම සිදු කරනු ඇත. (බලන්න පළමු පරිච්ඡේදය)

ලිඛිත මූලාශ්‍ර ආශ්‍රයෙන් අදාළ ක්ෂේත්‍රය පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීම පළමුව සිදු විය. මෙහි දී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, පොලිස් මත් ද්‍රව්‍ය නාශක අංශය, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාර මූලස්ථානය පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව, මත් ද්‍රව්‍ය හා මත්පැන් තොරතුරු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා සුමිත්‍රයෝ ආයතනය, ශ්‍රී ලංකා සමාජ සංවර්ධන පදනම යනාදී ආයතනවල ලිඛිත මූලාශ්‍රයන් භාවිතයට ගන්නා ලදී.

මේ අනුව මත්ද්‍රව්‍ය සම්බන්ධව ලියවී ඇති විවිධ ග්‍රන්ථ රාශියක් පරිශීලනය කරන ලද අතර පුනරුත්ථාපනය පිළිබඳව අවබෝධයක් ඇතිකර ගැනී ම සඳහා ඒ සම්බන්ධව ඇති විවිධ පත පොත පරිශීලනය කිරීම ද සිදු විය. මෙම ලිඛිත මූලාශ්‍ර මගින් සොයාගනු ලැබූ දත්ත මාගේ ක්ෂෙත්‍ර පර්යේෂණය පහසු කර වීමට මෙන්ම අදාළ සංකල්ප පැහැදිලිව නිර්වචනය කර ගැනීමටත් පුනරුත්තාපන ආයතන ආශ්‍රයෙන් ලබාගත යුත්තේ කුමන ආකාරයේ දත්ත ද යන්න පිළිබඳවත් පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට හැකි විය.

පර්යේෂණයේ ගුණාත්මක භාවය තහවුරු කර ගැනීම සඳහා අලිඛිත මූලාශ්‍ර වශයෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමය (Interview Method) ප්‍රත්‍යයික අධ්‍යයන ක්‍රමය (Case Study) මෙන්ම ප්‍රශ්නමාලා ක්‍ර මය සහ නිරීක්ෂණය යන විද්‍යාත්මක ක්‍රම වේදයන් ද ප්‍රධානව යොදාගන්නා ලදී. මෙහිදී සම්මුඛ සාකච්ඡා ක්‍රමය ඉතා වැදගත් විය. මන්ද යත් ප්‍රත්‍යයික අධ්‍යයන ක්‍රමයේ දී දත්ත ලබා ගැනීම සඳහා ප්‍රධාන ලෙස භාවිත වූයේ සම්මුඛ සාකච්ඡා ක්‍රමය බැවිනි.

අලිඛිත මූලාශ්‍ර භාවිතයේ දී පර්යේෂණයට අදාළව ප්‍රධාන නියැදි 2 ක් යොදා ගන්නා ලදී. එනම් ඌරාපොල නව දිගාන්ත සහ පැල්මඩුල්ල “මිතුරු මිතුරෝ” පුනරුත්ථාපන මධ්‍යස්ථාන දෙකෙහි තෝරාගත් සේවා ලාභීන් 60 දෙනෙකු පර්යේෂණ නියදිය වශයෙන් මෙම අධ්‍යයනයේදී යොදා ගන්නා ලදී.

පර්යේෂණයේ දී විවිධාකාර වූ බාධාවන් හා සීමාවන් හටද මුහුණ දීමට සිදුවිය. ක්ෂෙත්‍ර පර්යේෂණයේදී යොදාගත් මෙම නියැදිය අධ්‍යයනය කිරීම සඳහා වාර ගණනාවක් ම එම පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යාමට සිදුවිය. නියැදියට අදාළ සේවාලාභීන්ගෙන් අවශ්‍ය දත්ත ලබා ගැනීමට ඉතා අපහසු වූ අවස්ථාවන් ද විය. පර්යේෂණයේ ඇති වූ මෙවැනි සීමාවන් මගහරවා ගැනීම සඳහා ඔවුන් සමඟ මනා ලෙන්ගතුකමක් (Rapport) ඇති කර ගනිමින් අවශ්‍ය දත්ත ලබා ගැනීමට මම උනන්දු වූයෙමි.

අධ්‍යයනයේ දී ගම්‍ය වූ ප්‍රධාන නිගමන කිහිපයක් ද විය. මේවා අතර මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් සමාජයට වැඩදායක වූවන් බවට පුනරුත්ථාපනය කළ හැකි බව ඔවුන් පුනරුත්ථාපනය කරනු ලබන ආයතන මානුෂික මුහුණුවරකින් සංවර්ධනය කළ යුතු විම, සමාජ ආකල්ප නිවැරදි කිරීම, පුද්ගල පෞරුෂත්වය සංවර්ධනය කිරීම, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම පිළිබඳව නිවැරදි දැනුමක් පාසල් අධ්‍යාපන ක්‍රමයට ඇතුළත් කිරීම, මත්ද්‍රව්‍ය භාවිත කරන්නවුන් හට දෙනු ලබන නීතිමය දඬුවම් සංශෝධනය කළ යුතු වීම, මත්ද්‍රව්‍යවලට අදාළව පැහැදිලි රාජ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම ඔස්සේ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සීමා කිරීම ආදිය ප්‍රධාන වේ.

පොදුවේ ගත් කළ මෙම පර්යේෂණයෙන් ලබාගත්තා වූ දත්ත බුද්ධිමය හා ව්‍යවහාරික වශයෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට මෙන්ම සමාජයේ ජීවත්වන විවිධ පුද්ගලයින් සඳහා ද උපකාරී වේ යැයි සිතමි.